**AIA Insurance Lanka PLC** (Co. No. PQ 18)

Head Office
P O Box 2088
75, Kumaran Ratnam Road,
Colombo 2, Sri Lanka
T : (+94 11) 231 0310
F : (+94 11) 244 7620
E : lk.info@aia.com

AIALIFE.COM.LK

# Media Release

## AIA පොසොන් රැකවරණ වැඩසටහන මෙරට විශිෂ්ටතම තිරසාර සමාජ සත්කාර ව්‍යාපෘතීන් 5 අතරට එක් වේ

AIA ඉන්ෂුවරන්ස් මගින් අනුරාධපුර පූජා නගරය කේන්ද්‍ර කර ගනිමින් අඛණ්ඩව පුරා වසර 21ක් තිස්සේ ක්‍රියාත්මක කරන ලද පොසොන් රැකවරණ වැඩසටහන ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය මගින් මෙරට විශිෂ්ටතම තිරසාර සමාජ සත්කාර ව්‍යාපෘතීන් 5 අතරට තෝරා පත් කරමින් ඇගයුමට ලක් කෙරිණි.

AIA මගින් වසර 1993 සිට පුළුල් රැකවරණ වැඩසටහන් මාලාවක් දියත් කරමින් පොසොන් සමයේදී බැතිමතුන් දියේ ගිලීමෙන් සිදුවන මරණ සම්පූර්ණයෙන්ම පාහේ වළකාලීමට කටයුතු කරනු ලැබීය. ශ්‍රී ලංකාවේ අතිශය වැදගත් ආගමික උත්සවයක් වශයෙන් සැලකෙන පොසොන් උත්සවය සැමරීම සඳහා අනුරාධපුර පූජා නගරය වෙත වාර්ෂිකව මිලියනයකට ආසන්න බැතිමතුන් පිරිසක් පැමිණෙති.

මෙලෙස පැමිණෙන බැතිමතුන්ගේ ආරක්ෂාව උදෙසා AIA ඉන්ෂුවරන්ස්, ජීවිතාරක්ෂකයින් 600 කට අධික පිරිසකගේ සේවය ලබා ගන්නා අතර දිස්ත්‍රික්කයේ ජලාශයන්හි දිය නෑමේ අවදානම පිළිබඳ ජනතාව දැනුවත් කෙරෙන්නා වූ පුළුල් ප්‍රචාරණ ව්‍යාපෘතියක් මෙයට සමගාමීව දියත් කෙරේ. මෙහිදී සමාගම මගින් අනුරාධපුර දිස්ත්‍රික්කය පුරා අවවාදාත්මක පුවරු, බැනර් ආදිය ප්‍රදර්ශනය කෙරේ. මෙයට අමතරව රූපවාහනී මාධ්‍යයෙන් සහ මහජන ඇමතුම් පද්ධති ඔස්සේද දියනෑමේදී ප්‍රවේශම් වන ලෙස දැනුවත් කිරීම් සිදු කෙරේ. මෙම රැකවරණ වැඩසටහන වෙනුවෙන් නිර්මාණය කරන ලද වෙළඳ දැන්වීම නොබෝදා පැවති සුමති ටෙලි සම්මාන උළෙලේ දී 2013 හොඳම රූපවාහිනී දැන්වීම වශයෙන් ද සම්මානයට පාත්‍ර විය.

වසර 2014 දී ශ්‍රී ලංකා ජීවිතාරක්ෂණ සංගමය, ශ්‍රී ලංකා පොලීසිය සහ නාවික හමුදාවට අයත් ජීවිතාරක්ෂකයින් යොදා ගනිමින් වටිනා ජීවිත 9ක් ගලවා ගැනීමට AIA ඉන්ෂුවරන්ස් සමත් විය. මෙම පිරිස බේරා ගැනුනේ අනුරාධපුරය පොළොන්නරුව සහ දඹුල්ල යන ප්‍රදේශයන් ආශ්‍රිතව දියනෑමේදී සිදුවූ අනතුරු වලිනි.

අලෙවි අංශ ප්‍රධානි සුරේන් පෙරේරා සමාගම වෙනුවෙන් අදාළ සම්මානය හිමිකර ගනිමින් මෙසේ සිය අදහස් පළ කළේය. ''පොසොන් සමයේදී දිවි සුරැකීම'' යන තේමාවෙන් යුතුව දියත් කරන ලද මෙම ප්‍රජා සත්කාරය අප සමාගමෙහි මෙවැනි ව්‍යාපෘතීන් සාර්ථකව සංවිධානය කිරීමේ හැකියාව මැනවින් විදහා දක්වෙනවා. අප නිරතුරුවම මෙම ව්‍යාපෘතියෙහි සාර්ථකත්වය මැන බලමින් එයට වැඩි වටිනාකම් එක් කිරීමට කටයුතු කරන අතර බැතිමතුන්ගේ පහසුව උදෙසා මෙයට පස් වසරකට පෙර අරඹන ලද අනුරාධපුරය සහ මිහින්තලය අතර නොමිලේ ක්‍රියාත්මක වන දුම්රිය සේවය එහි ප්‍රතිඵලයක් වශයෙන් පැවසිය හැකියි. මෙවන් ජාතික වැදගත්කමකින් යුතු සමාජ සත්කාරයක් ඔස්සේ ප්‍රබල කාර්යභාරයක් ඉටු කිරීමට හැකිවීම ගැන අප ඉමහත් සේ අභිමානයට පත් වෙනවා.''

සමාප්තයි.

Media Enquiries: Suren Perera, Head of Marketing & Company Spokesman Office 2310028, Mobile – 0773 457 959